රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 04/2016

මගේ අංකය : EST/6/06/HUS/1010
රාජ්‍ය පරිපාලන හා
කළමනාකරණ අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07

2016.08.26

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**ආයතන සංග්‍රහයේ XIX වැනි පරිච්ඡේදයේ 5 වගන්තිය සංශෝධනය කිරීම**

**රජයේ නිවාස කුලිය**

ආයතන සංග්‍රහයේ XIX වන පරිච්ඡේදයේ 5:4 හා 5:4:1 උප වගන්ති කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. එම උප වගන්ති පහත පරිදි සංශෝධනය කිරීමට 2016.02.03 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී තීරණය කර ඇත.

5:4 රජයේ සේවයේ නිරත අඹුසැමි යුවලක් රජයේ නිවාසයක පදිංචි වී සිටින අවස්ථාවක දී නිවාසය ලබා ගැනීමට හිමිකම් ලබන නිලධරයාට උප ලේඛනගත නිවාස හිමිකමක් නැතිනම්, එම නිලධරයාගේ වැටුපෙන් සියයට දොළහ හමාරක් (12 ½) අයකර ගත යුතුය.

5:4:1 රජයේ නිවාසය ලබා ගැනීමට හිමිකම් ලබන නිලධරයාට උප ලේඛනගත නිවාස ලබා ගැනීමට හිමිකමක් තිබේ නම්, එම නිලධරයාගේ වැටුපෙන් සියයට දහයක් (10) අයකර ගත යුතුය.

03. ඉහත විධිවිධාන 2016.02.03 දින සිට ක්‍රියාත්මක වේ.

04. මෙම චක්‍රලේඛය මහා භාණ්ඩාගාරයේ එකඟතාව ඇතිව නිකුත් කරනු ලැබේ.

ජේ.ජේ. රත්නසිරි
ලේකම්
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය